MATHSLAND
by Anupa Chathuranga
0714705313

# 11 ශ්‍රේණිය

## මාසික පරීක්ෂණ අංක ~ 2

අනුප චතුරංග
ගණන් ලොවේ කාරයින්ට

**1.** පහත දී ඇති අබිල කරණී, කරණී බවට හරවන්න.

$(a)\ \sqrt{24}$ $(b)\ \sqrt{48}$

**2.** පහත දී ඇති කරණී, අබිලකරණී බවට හරවන්න.

$(a)\ 5\sqrt{3}$ $(b) 7\sqrt{2}$

**3.** පහත දර්ශක සුළු කර පිළිතුර ධන බල ලෙස දක්වන්න.

$(a)(2x^2)^3 \times 5 \times x^3$ $(b)(3y^4)^{-3} \times 3^5 \times y^3$

$(c)\left(\dfrac{x^5 \times y^5}{y^3 \times x^2}\right)^0$ $(d)(a^{-7} \times b)^{-3} \times a^{-2} \times b^{-3}$

**4.** අගය සොයන්න.

$(a)(36)^{\frac{1}{2}}$ $(b)\ (16)^{\frac{-1}{4}}$

**5.** $\left[\dfrac{64}{27}\right]^{\frac{2}{3}}$ සුළු කරන්න.

**6.** ඝනකයක පැත්තක දිග ඒකක 2ක් වේ.එහි,

$(a)$ මුළු පෘෂ්ඨ වර්ගඵලය $(b)$ පරිමාව සොයන්න.

A.N.U.P.A CHATHURANGA

**7**. මෙහි දැක්වෙන්නේ අධාරකය සමචතුරස්‍රයක් වන ඝන ඍජු ප්‍රිස්මයකි.සමචතුරස්‍ර පතුලේ පැත්තක දිග ඒකක $a$ ද ත්‍රිකෝණාකාර මුහුනතක ශීර්ෂයේ සිට සම්මුඛ පාදයට ලම්බ දුර ඒකක $x$ ද ලෙස ගෙන පිරමීඩයේ මුළු පෘෂ්ඨ වර්ගඵලය $a$ හා $x$ ඇසුරින් සොයන්න.




**8**. මෙහි දක්වා ඇත්තේ කේතුවක් සාදා ගැනීමට යොදා ගත් පතරොමක දල සටහනකි. මෙමගින් සෑදිය හැකි ප්‍රිස්මයේ ඇල උස හා පතුලේ අරය සොයන්න.




**9**.පැත්තක දිග සෙන්ටිමීටර් $3a$ වූ සමචතුරස්‍රාකාර පතුලක් සහිත උස සෙන්ටිමීටර් $h$ වන ඝනකාභ හැඩැති භාජනයක පතුලේ සිට සෙන්ටිමීටර් $x$ උසකට ජලය පුරවා ඇත.

$(a)$ භාජනයේ ඇති ජල පරිමාව සඳහා වීජීය ප්‍රකාශණයක් $a$ හා $x$ ඇසුරින් ගොඩ නඟන්න.

* පතුලේ අරය හා උස සෙන්ටිමීටර් $a$ බැගින් වූ ඝන ඍජු වෘත්ත සිලින්ඩරයක්,ඉහත භාජනයේ ඇති ජලයේ සම්පූර්ණයෙන් ගිල්වනු ලැබේ.

$(b)$ සිලින්ඩරයේ පරිමාව $a$ හා $\pi$ ඇසුරින් සොයන්න.

$(c)$ සිලින්ඩරය ගිල්වීමෙන් පසුව භාජනයේ ජලය උතුරා යන මට්ටමට ලං වුනි නම් $9(h-x)=\pi a$ බව පෙන්වන්න.

**10**. සම්පූර්ණයෙන්ම ජලයෙන් පිරී ඇති අර්ධ ගෝලාකාර $A$ භාජනයේ ඇති ජලය තත්පරයට $6cm^3$ ක නියත ශ්‍රීඝ්‍රතාවයකින් යුක්තව පොම්පයක් මඟින් ඍජු වෘත්ත කේතු ආකාර $B$ භාජනයට පොම්ප කරයි. $B$ භාජනයේ උස $14cm$ වේ.

$(a)$ තත්පර $22$ දී $B$ භාජනය සම්පූර්ණයෙන් පිරේනම් $B$ භාජනයේ ධාරිතාව $132cm^3$ බව පෙන්වන්න.

$(b)$ $B$ භාජනය සම්පූර්ණයෙන් පිරුණු පසුවද පොම්පය ක්‍රියාත්මක වෙමින් පවතී. $A$ භාජනයේ අරය සෙන්ටිමීටර් $r$ නම් එහි ඇති ජලය සම්පූර්ණයෙන් ඉවත්වීමට ගන්නා කාලය තත්පර $\frac{22}{63}r^3$ බව පෙන්වන්න




ANUPA CHATHURANGA